මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06

මුළු පිටු ගණන : 02

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

2011 විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය - I කොටස පරීක්ෂණය - 2014 මැයි

BME 1501- කළමනාකරණය හැඳින්වීම

**උපදෙස්**

I. කාලය : **පැය තුනයි (03).**
II. ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සමන්විත වන අතර, ඉන් ප්‍රශ්න **පහකට (05) පමණක්** පිළිතුරු සැපයිය යුතුය.
III. පිළිතුරු නිශ්චිත සහ පැහැදිලි විය යුතුය.
IV. මුළු ලකුණු ගණන 100 යි.

**ප්‍රශ්න අංක 01**

(අ) "කළමනාකරණය කලාවක් සහ විද්‍යාවක් යන විවිධ දෘෂ්ඨිකෝණයන්ගෙන් දැකිය හැක." කළමනාකරණය ඉහත සඳහන් දෘෂ්ඨිකෝණයන් දෙකට අදාළව විස්තර කරන්න.

(ලකුණු 10 යි)

(ආ) "වර්තමාන ව්‍යාපාරික සන්දර්භය විසිවන ශතවර්ෂයේ මුල් භාගයේ පැවතියාට වඩා මුළුමනින්ම පාහේ වෙනස් වී ඇත. එසේ වුවද, එම කාලයේ හඳුන්වාදුන් කළමනාකරණ පරිචයන් (Practices) වර්තමාන ව්‍යාපාර සංවිධාන කළමනාකරණයේදී පවා යොදාගත හැක."

ඉහත ප්‍රකාශයෙහි වලංගුතාවය විද්‍යාත්මක කළමනාකරණ ප්‍රවේශය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10 යි)
(මුළු ලකුණු 20 යි)

**ප්‍රශ්න අංක 02**

(අ) පහත සඳහන් සංවිධාන වල ව්‍යුහයන් තුල දෙපාර්තමේන්තුකරණයට වඩාත් සුදුසු පදනම් පැහැදිලි කරන්න.

i. රෝහලක්
ii. ඇඟලුම් කර්මාන්ත ශාලාවක්
iii. උපදේශක සේවා සපයන කුඩා ආයතනයක්
iv. විශාල බහුජාතික සමාගමක්

(ලකුණු 10 යි)

(ආ) ව්‍යාපාර සංවිධානයක පවතින සංයුක්ත (Corporate), ශ්‍රිතිය (Functional) සහ මෙහෙයුම් (Operational) වශයෙන් ඇති සැලසුම් වර්ග තුන සංසන්දනය කර වෙනස්කම් දක්වන්න.

(ලකුණු 10 යි)
(මුළු ලකුණු 20 යි)

**ප්‍රශ්න අංක 03**

(අ) මිල්රෝ ලිමිටඩ් යනු නුගේගොඩ ප්‍රදේශයේ ස්ථාපිතව ඇති ගොඩනැගිලි ඉදිකිරීමේ යෙදී සිටින සමාගමකි. එම සමාගම සිවිල් ඉංජිනේරුවරුන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, පෙදරේරුවන් සහ අත්උදව්කරුවන් යන විවිධ වූ පුහුණු සහ නුපුහුණු පුද්ගලයන්ව සේවයේ යොදවයි. මිල්රෝ සමාගම එම කර්මාන්තයේ වෙනත් සමාගම් වල වේතන වලට වඩා වැඩි වේතනයක් තම සේවකයන්ට ලබා දෙයි. එසේ වුවද සමහර සේවකයින් තම රැකියාව පිළිබඳව අතෘප්තියකින් සිටිනු දක්නට ලැබේ.

එම නිසා, සුදුසු අභිප්‍රේරණ ක්‍රියාපටිපාටියක් නිර්මාණය කිරීම සඳහා මිල්රෝ ලිමිටඩ්හි කළමනාකරණ අධ්‍යක්ෂකවරයාට උපදේශ අවශ්‍ය වී ඇත. මේ සඳහා ඔබ විසින් කළමනාකරණ අධ්‍යක්ෂකවරයාට උපදෙස් සපයන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
(සටහන: ඔබ විසින් සුදුසු අභිප්‍රේරණ න්‍යායන් අදාළ කරගත යුතුය.)

(ලකුණු 10 යි)

(ආ) "ප්‍රධාන විධායක නිලධාරීහු සංවිධාන වල අනාගතයට බලපාන වඩා වැදගත් තීරණ ගනිති. එම නිසා ඔවුන්ට සංකල්පනාත්මක කුසලතා (Conceptual Skill) පමණක් පැවතීම ප්‍රමාණවත් වේ."
ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද ? ඔබේ පිළිතුර සාධාරණීය කරන්න.

(ලකුණු 10 යි)
(මුළු ලකුණු 20 යි)

**ප්‍රශ්න අංක 04**

(අ) "නායකයන් උපතින්ම බිහිවන අතර ඔවුන්ව නිර්මාණය කළ නොහැක."
"නායකත්වයෙහි සඵලදායිත්වය යටත් සේවකයන්ගේ ගති ලක්ෂණ මත තීරණය වේ."
ඉහත ප්‍රකාශයන් මගින් අභවනු ලබන නායකත්ව න්‍යායන් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

(ආ) ව්‍යාපාර සංවිධානයක කළමනාකරුවකු ලෙස සන්නිවේදනය සඵලදායීව සිදු කිරීමේදී ඔබ මුහුණදෙන බාධාවන් පැහැදිලි කර එම බාධාවන් වළක්වාගැනීම සඳහා යොදාගත හැකි සුදුසු උපාය මාර්ග නිර්දේශ කරන්න.

(ලකුණු 10 යි)
(මුළු ලකුණු 20 යි)

**ප්‍රශ්න අංක 05**

(අ) "පාලනය යනු තනි පියවරකින් කරන කාර්යයක් නොවේ."
ඉහත ප්‍රකාශය පාලන ක්‍රියාවලියට (Controlling Process) අවධානය යොමු කරමින් විස්තර කරන්න.

(ලකුණු 10 යි)

(ආ) "තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලිය අනුගමනය කරන කළමනාකරුවෙකුට යම් ගැටළුවක් සඳහා වන හොඳම විසඳුමට පැමිණීමට හැකියාව ඇත."
ඉහත ප්‍රකාශයෙහි වලංගුතාවය තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාලව විස්තර කරන්න.

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 20 යි)

**ප්‍රශ්න අංක 06**

පහත සඳහන් මාතෘකා කෙටියෙන් පැහැදිලි කරන්න.

අ) හෙන්රි මින්ස්බර්ග් ගේ කළමනාකරණ භූමිකාවන් (Henry Mintzberg's Managerial Roles)

ආ) පරිවර්තීය නායකත්වය (Transformational Leadership)

ඇ) ව්‍යුහමය පාලනයන් (Structural Controls)

ඈ) ශ්‍රම බලකායෙහි විවිධත්වය (Workforce Diversity)

(ලකුණු 05 බැගින්)

(මුළු ලකුණු 20 යි)

************